වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual REPORT

2024

ඉඩම් මැනුම් සභාව

நில அளவைச் சபை

Land Survey Council

ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05

நில அளவைச் சபை, நில அளவையாளர் அதிபதி அலுவலகம்,இல.150 பெர்னாட்கொழும்பு 05

Land Survey Council, Surveyor General's Office,No 150, Colombo 05

පටුන

1.	සභාපතිතුමාගේ පණිවුඩය	02
2.	දැක්ම සහ මෙහෙවර	03
3.	ඉඩම් මැනුම් සභාව	04
4.	ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්	05
5.	ඉඩම් මැනුම් සභාව සතු බලතල	06
6.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තාව	07
7.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය	08
8.	ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්	08
9.	අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු	13
10.	මූල්‍ය කළමනාකරණය	15
11.	2024 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය	17
	I. මූල්‍ය තත්ව ප්‍රකාශනය	
	II. මූල්‍ය කාර්ය සාධන ප්රකාශනය	
	III. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	
	IV. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	
	V. 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන	
	VI. 2024 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති	
12	විගණකාධිපති වාර්තාව 2024	26

01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
අංක150,
කොළඹ 05.
21-02-2025

1800 අගෝස්තු 02 වන දින ආරම්භ කරන ලද මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි 2002 අංක 17 දරන මැනුම් පනතේ විධි විධාන වලට අදාලව 2003 මාර්තු මස ශ්‍රී ලංකා මැනුම් සභාව ආරම්භ කර ඇත.

මෙමගින්, ඉඩම් මැනීමට අදාල කාර්යය පටිපාටිය පවත්වාගෙනයාම, ඉඩම් මැනීම් කටයුතුවල යෙදෙන අතර වෘත්තිමය විනය පවත්වාගෙනයාම, වෘත්තිමය අධ්‍යානය පිළිබඳ උසස් ප්‍රමිතින් පවත්වාගෙනයාම, ප්‍රවර්ධනය කිරීම, දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට අමතර වශයෙන් සබරගමුව විශ්ව විද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය අධ්‍යන වෙතින් මැනුම් විද්‍යා උපාධිධාරීන් ලියාපදිංචි කිරීම, මැනුම් වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම.

ඒ සඳහා වෘත්තිමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම මෙන්ම නවීන තාක්ෂණයෙන් හා දැනුමෙන් පරිපූර්ණ වෘත්තිකයන් බිහිකිරීමටත්, වෘත්තිමය පිළිගැනීම ලබා දීමට කටයුතු කිරීම මෙහි අභිලාෂයන්වේ.

එසේම මැනුම් කිරීමේදී මහජනතාව හට ඇතිවන ගැටළු නිරාකරණය කිරීමට මැදිහත්වීම තුළින් මනා සේවාවක් ඉටු කිරීමට ලැබීම මහගු සත් කාර්යයක් වේ.

මෙම අභිලාෂයන් ඉටු කිරීම සඳහා 2024 තුළ මැනුම් සභාව සම්බන්ධ කටයුතු කළ සභාපති, උපසභාපති, වැඩබලන ලේකම් හා කමිටු සාමාජිකයන් ඉටුකරන ලද ප්‍රශංසනීය සේවාව වෙනුවෙන් මාගේ ස්තූතිය පුද කරමි.

එසේම ඉදිරියේදී මෙම කටයුතු සාක්ෂාත් කර ගැනීමටත් මැනුම් කාර්යයේදී ගැටළු නිරාකරණය කිරීමට මැදිහත් වෙමින් මහජනතාවට සුහදශීලී සේවාවක් ලබාදෙමින් ඉදිරියට යාමට හැකි වේවායි පතමි.

වයි. ජී.ඥාණතිලක
සභාපති

02. දැක්ම සහ මෙහෙවර

දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛන්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත් වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තියමය පරිසරය ශක්තිමත් කිරිම අපගේ මැනුම් සභාවේ දැක්ම වේ.

මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරිම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරන මැනුම් පනතෙහි 26 වැනි වගන්තියේ සඳහන් විධි විධාන අනුව කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුළ 2003 වර්ෂයෙහි මාර්තු මාසයේදී ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලදී.

මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතුද යන්න පිළිබඳව විධි විධාන සලස්වා ඇත. එකී විධි විධාන වලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත් වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

- i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා
- ii. උප සභපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරු වරයෙකු
- iii. සාමාජික - 1969 අංක 21 මැනම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත්වන සාමාජිකයින්

- i. සාමාජික - 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

- ii. සාමාජික - 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයකින් නම් කරණු ලබන අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ

04. ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්

ඉහත පනතේ 37 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) ඉඩම් මැනිමට අදාළ ප්‍රමිති හා කාර්යය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනිමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තිමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරිම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනිම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනිමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරිම.

(ඇ) වෘත්තියේ යෙදිමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරිම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනිම සහ ඉඩම් මැනිමේ වෘත්තියෙහි යෙදිමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහිමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරිම.

(ඈ) ඉඩම් මැනිමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතින් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරිම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනිමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරිමේ කාර්යය සඳහා වෘත්තිමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධන කිරිම.

(ඊ) ඉඩම් මැනිම පිළිබඳ ශාස්ත්‍රිය හා වෘත්තිමය සුදුසුකම් පිළිගැනිම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරිම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි විමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරිම සඳහා වු අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබිමේ විභාග හා වෘත්තිමය සම්මුඛ පරික්ෂණ පැවැත්විම.

(උ) ඉඩම් මැනිමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනිම යන කරුණුවලදී සම තත්වයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරිම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යොන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ගැනිම හා ක්‍රියාත්මක කිරිම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරිම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තිමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතින් පවත්වාගෙන යාම

05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

05.1 මැනුම් පනතේ 38 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාව සතු බලතල පහත පරිදි වේ.

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

(ඇ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

05.2 මැනුම් පනතේ 47 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාව සතු විනය බලතල පහත පරිදි වේ.

(1) මේ කොටසට අනුකූලව පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවකදී සභාව විසින් පහත සඳහන් නියමයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් කරනු ලැබිය හැකිය :-

(අ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවලංගු කොට ඒ මිනින්දෝරුවරයාගේ නම, නාම ලේඛනයෙන් ඉවත් කරන ලෙස වූ නියමයක් කිරීම :

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා අත්හිටුවන ලෙස වූ නියමයක් කිරීම :

(ඇ) ලියාපදිංචි මිනින්දෝරුවරයකුට නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් අත්හිටුවන ලෙසට වූ නියමයක් කිරීම :

(ඉ) සභාව විසින් පනවනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදීමට ලියාපදිංචි මිනින්දෝරුවරයාට හැකි බවට වූ නියමයක් කිරීම :

(ඊ) ගාස්තු පිළිබඳව හෝ සභාව විසින් උචිත යයි සලකනු ලබන අන්‍යාකාර වූ, වෙනත් යම් උචිත නියමයක් කිරීම.

(2) මේ වගන්තිය යටතේ වූ ලියාපදිංචිය අත්හිටුවීමේ නියමයක් බලාත්මකව පවතින විට ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය. නමුත් ඒ නියමය අවසන් වූ වහාම එසේ අවසන්වීමේ දින සිට ලියාපදිංචි මිනින්දෝරුවරයකු ලෙස ඔහුගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද නැවත ලබාදිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු සියලු ගාස්තු සහ වියදම් සභාවට අයවිය යුතු ණයක් වශයෙන් සභාව විසින් අයකරගනු ලැබිය යුතු ය.

06. 2024 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තා

06.1 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල සීමාව තුල සභාවේ සංයුතිය සහ එම සාමාජිකයින්ගේ පත්වීම් දින පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	කාලසීමාව
1	ඩබ්.එස්.එල්.සී.පෙරේරා මයා	සභාපති	202401.01 සිට 2024.12.31 දක්වා
2	යූ.එම්.ජී.බී.අලහකෝන් මයා	උප සභාපති	2024.01.01 සිට 2024.12.22 දක්වා
3	යූ.කේ.එස්.පී.විජේසිංහ මයා	උප සභාපති	2024.12.23 සිට 2024.12.31 දක්වා
4	යූ.කේ.එස්.පී.විජේසිංහ මයා	සාමාජික	2023.02.23 සිට 2024.01.15 දක්වා
5	එෆ්.එල් කරුණාරත්න මයා	සාමාජික	2024.01.15 සිට 2024.12.22 දක්වා
6	ආර්.එල්.කේ. ජයසුන්දර මයා	සාමාජික	2024.01.01 සිට 2024.12.31 දක්වා
7	ඩබ්.එස්.එස්.ජී. ප්‍රනාන්දු මයා	සාමාජික	2024.01.01 සිට 2024.12.31 දක්වා
8	එම්.ජී.නසූර් මයා	සාමාජික	2024.01.01 සිට 2024.12.31 දක්වා
9	මහාචාර්ය කේ.එම්.සී.කොන්තසිහ මයා	සමාජික	2024.01.01 සිට 2024.05.31 දක්වා
10	ආචාර්ය වරුණ අධිකාරිවත්තගේ මයා	සාමාජික	2024.06.01 සිට 2024.12.31 දක්වා

<u>සටහන:</u> මැනුම් පනත ප්‍රකාරව සභාවේ ඉහත සංයුතියට අමතරව මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් නියෝජිතයෙකු සභාවේ මාසික පාලක මණ්ඩල රැස්වීම් පාලක මණ්ඩල රැස්වීම් සඳහා සඳහා සහභාගී වේ. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා, මුදල් අමාත්‍යාංශ නියෝජිත ලෙස, සහභාගී වීම පහත පරිදි වේ.

අනු අංකය	නම	කාල සීමාව
1	**ඩී.සී.ජයදේව මිය**	2024.01.01 සිට 2024.11.26 දක්වා
2	**ආර්.ජී.පී.රාජපක්ෂ මිය**	2024.11.27 සිට 2024.12.31 දක්වා

06.2 2022.01.01 දින සිට 2022.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව තුල මාසික සභා රැස්වීම් 09 ක්, මහජන පැමිණිලි විමර්ශනය සඳහා රැස්වීම් 07 ක් හා උප කමිටු රැස්වීම් 07 ක් පවත්වා ඇත.

එම රැස්වීම් සඳහා එක් එක් සමාජිකයින්ගේ සහභාගීවීම් පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	මාසික රැස්වීම්	විමර්ශණ රැස්වීම	උපකමිටු
1	ඩබ්.එස්.එල්.සී.පෙරේරා මයා	සභාපති	09	04	01
2	යූ.එම්.ජී.බී.අලහකෝන් මයා	උප සභාපති	09	05	04
3	යූ.කේ.එස්.පී.විජේසිංහ මයා	උප සභාපති	-	-	-
4	යූ.කේ.එස්.පී.විජේසිංහ මයා	සාමාජික	-	-	-
5	එෆ්.එල් කරුණාරත්න මයා	සාමාජික	09	06	03
6	ආර්.එල්.කේ. ජයසුන්දර මයා	සාමාජික	08	05	07
7	ඩබ්.එස්.එස්.ජී. ප්‍රනාන්දු මයා	සාමාජික	08	06	08
8	එම්.ජී.නසූර් මයා	සාමාජික	08	05	09
9	මහාචාර්ය කේ.එම්.සී.කොන්තසිහ මයා	සමාජික	02	-	-
10	ආචාර්ය වරුණ අධිකාරිවත්තගේ මයා	සාමාජික	03	-	02

07. ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව 2024.01.01 දින සිට 2024.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	පත්වීම් දිනය
1	පී.ඩී.අනුරසිරි මයා	ලේකම් / වැඩ බලන	2023.03.01
2	පී.එච්.එන්.නිමලවීර මයා	ලේකම් / වැඩ බලන	2024.03.01
3	සී.ජේ.වැල්ලගේ මයා	ලේකම් / වැඩ බලන	2024.04.01
4	කේ.එල්.ඒ.එන්.සඳමාලි මිය	ගණකාධිකාරී / අර්ධ කාලීන	2021.10.05
5	ඩබ්.ඩී.එස්.පී.සිරිවර්ධන මයා	ගණකාධිකාරී / අර්ධ කාලීන	2024.09.01
6	ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනී මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු	2004.05.24
7	එච්. කේ. කුලතුංග මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2024.07.18
8	ඒ.එච්. දහනායක මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2024.11.10
9	එම්.ඩී.එච්.හන්සනී මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2024.12.08
10	ටී.ජී.ප්‍රනාන්දු මයා	කාර්යාල කාර්යය සහයක	2004.07.15
11	ටී.ජී.ප්‍රනාන්දු මයා	කාර්යාල කාර්යය සහයක (කොන්ත්‍රාත් පදනම මත)	2024.11.04

08. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්

08.1. ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි කිරීම් සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නව රෙගුලාසි සකස් කිරීම.

මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය හෝ පශ්චාත් උපාධිය සහිත මිනින්දෝරු වෘත්තිකයන් හට ඔවුන්ගේ වෘත්තීය පිළිගැනීම ලබාදීම සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දීමට මෙතෙක් භාවිතා වූ වැඩපිළිවෙල වූයේ පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමෙන් පසු ප්‍රායෝගික පුහුණුව ලබාගැනීමෙන් ලියාපදිංචිය ලබා දීම වේ. එහෙත් මේ වන විට විශ්වවිද්‍යාල වලින් පිටවන මැනුම් විද්‍යා උපාධිය හෝ පශ්චාත් උපාධිය සහිත වෘත්තිකයන් සියළු දෙනා දෙපාර්තමේන්තුවට බඳවා නොගන්නා බැවින් සැලකිය යුතු පිරිසකට ලියාපදිංචිය ලබාගැනීමට ගැටළු සහගත වී තිබුණි. එවනි වෘත්තිකයන් සඳහා ලියාපදිංචිය ලබාදීම වෙනුවෙන්, පනතේ විධිවිධාන වලට ප්‍රකාරව නව රෙගුලාසි සකස් කොට 2024.12.27 දින අංක 2,417 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කරන ලදී. එමෙන්ම එවනි ලියාපදිංචි මිනින්දෝරුවරයෙකුට හට පුද්ගලික සේවයේ යෙදීමට නිකුත් කරනු ලබන වාර්ෂික මැනුම් බලපත්‍රය ලබාදීම සඳහා ලියාපදිංචිය මෙන්ම සමාන්තර රෙගුලාසිද එම ගැසට්පත්‍රයට ඇතුලත්ව ඇත.

එමෙන්ම 2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේද මැනුම් විද්‍යා උපාධිධාරීන් හට ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා ගැනීම වෙනුවෙන් අවශ්‍ය කරනු ලබන ප්‍රායෝගික පළපුරුද්ද ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම 2024.10.18 දින අංක 2,407 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී. දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් එම ප්‍රායෝගික පළපුරුද්ද ලබාදීම සිදු කරනු ලැබේ.

8.1 ලියාපදිංචි කිරීම.

2024.01.01 දින සිට 2024.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා, මැනුම් පනතෙහි 39 වැනි වගන්තිය සමඟ කියවිය යුතු උපලේඛනය අනුව ශාස්ත්‍රීය සුදුසුකම් හා නියමිත ප්‍රායෝගික පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් 09 දෙනෙකු (2023 වර්ෂයෙන් ඉදිරියට ගෙනෙන ලද අයදුම්පත්‍ර 03 ක් ද සමඟ) ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත්‍ර යොමු කරන ලදි.

එලෙස ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද, හැකියාව, නිපුණතාවය හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉන් අයදුම්කරුවන් 09 දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දෙන ලදී. 2023 වර්ෂය තුලදී ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දෙන ලද සංඛ්‍යාව 29 කි. මෙය එම වර්ෂය හා සැළකීමෙදී 20 කින් පමණ අඩුවීමකි.

එසේම ශාස්ත්‍රීය සුදුසුකම්, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද හා හෝ නියමිත පරිදි අයදුම්පත්‍ර යොමු නොකිරීම හේතුවෙන් ඉල්ලුම්පත්‍ර 03 ක් ප්‍රතික්ෂේප කරන ලදි.

ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා ගත්තා ලද සමස්ථ මිනින්දෝරු සංඛ්‍යාව 2480 කි.

2023 සහ 2024 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් ශාස්ත්‍රීය සුදුසුකම් හා, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් වෙත ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දීම පිළිබඳ සංඛ්‍යාමය තොරතුරුවල ප්‍රස්තාරික නිරූපණය පහත දක්වා ඇත.



1 වැනි රූපය

08.3 වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවීම 2024 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී අරඹන ලදි. ඒ අනුව 2024 වර්ෂය වෙනුවෙන් වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර 910ක් ලැබී තිබූ අතර විවිධ අඩුපාඩු හේතුවෙන් ඉන් අයදුම්පත්‍ර 26 ක් ක් ප්‍රතික්ෂේප කරන ලදි. ඒ අනුව 2024 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 884 ක් නිකුත් කර ඇත.

ඉඩම් මැනුම් සභාව විසින් 2023 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 903 ක් නිකුත් කරන ලද අතර එය මෙම වසර හා සැලකීමෙහිදී බලපත්‍ර 13ක තරම් අඩුවීමකි. 2023 වසරට සාපේක්ෂව මෙම අඩුවීම ප්‍රතිශතයක් ලෙස 1.46% ක් වේ.

2023 සහ 2024 වර්ෂයන් තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරුවල ප්‍රස්තාරික නිරූපනය පහත දක්වා ඇත.



2 වැනි රූපය

2024 ජනවාරි 1 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර 2024 මාර්තු මස 28 දින අංක 2,378 දරන ගැසට් පත්‍රයන්හි පළකර ප්‍රසිද්ධියට පත් කර ඇත.

මීට අමතරව වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුණුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තීයේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදි විස්තර www.landsurveycouncil.org වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. තව ද මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

08.4 මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳ මහජනතාව දැනුවත් වී ඇති නිසා වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධව වුවද ඒවාට සම්බන්ධ වාර්ෂික මැනුම් බලපත්‍ර ලාභී මිනින්දෝරුවරුන්ගේ ජීව විස්තර තොරතුරු ලබා ගැනිම සඳහා නිබඳවම ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් බොහෝය. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දිම සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර ලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. හැකිතාක් දුරට මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංකද ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනිමට දුරකථන මගින් ඔවුන් සම්බන්ධ කර ගැනිමේ පහසුකම මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද මේ දක්වා අප විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙළ කළ පැරණි පිඹුරු වල පිටපත් ලබා

ගැනිමෙ දී ලත් පිටුවහල ක්‍රමානුකූල නොවීම පිළිබඳව මැනුම් සභාව තෘප්තිමත් නොවේ. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙල කරනු ලබන පිඹුරු වල පිටපත් ලබා ගැනීම හා හෝ ඊට අදාල වෙනත් තොරතුරු ලබා ගැනීමේ පවතින දුෂ්කරතාව මහජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට සභාවේ අවධානය මේ වන විට යොමු වී ඇත.

කෙසේ වුවද සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 114කදී මෙම තොරතුරු ලබා දී ඇත.

08.5 ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි

ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන මැනුම් කටයුතු හා පිළියෙල කරනු ලබන පිඹුරු වලට සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තව්‍යයකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කෙරෙනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන වලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක් හෝ දෙවරක් (ලැබී තිබෙන පැමිණිළි ප්‍රමාණය අනුව) ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක් විමර්ශන වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් පමණ විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන ඉඩම් මැනුම් හා හෝ ඔවුන් විසින් පිළියෙල කරනු ලබන පිඹුරු සම්බන්ධයෙන් පවතින ගැටළු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතරම මිනින්දෝරුවරුන්ගේ වෘත්තිය විනය හා වෘත්තිය සදාචාරය වැඩි දියුණු කර ගැනීමට අවස්ථාවක්ද මින් සැලසෙනු ඇත.

කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකළ නොහැකි ගණයේ පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාල පැමිණිලිකරුවන්ට එම ගැටළු අධිකරණ ක්‍රියාමාර්ගයෙන් විසඳා ගැනීමට හෝ අවස්ථානුකූලව වෙනත් සුදුසු ප්‍රතිකර්ම ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2024 වර්ෂයට පෙර වර්ෂයන්හි ලැබී එහෙත් එම වර්ෂයන්හි විභාග කර අවසන් කිරීමට නොහැකි වූ පැමිණිලි හා සමාලෝචිත වර්ෂය තුල ලැබුණු හා එකී වර්ෂය තුල විභාග කර අවසන් කරන ලද පැමිණිලි පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත දැක්වේ.

2023 දෙසැම්බර් මස 31 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව	= 149
2024 වසර තුළදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	= 56
2024 වසර තුළදී අඩුපාඩු හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 00
2024 වසර තුළදී විභාග කර අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 42
2024 දෙසම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව	= 163

2023 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 80 වූ අතර එයට සාපේක්ෂව 2024 වසර තුළ පැමිණිලි ලැබීමෙ ප්‍රතිශතය 30% කින් අඩුවී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2023 වසරේදී 63ක් වූ අතර එයට සාපේක්ෂව 2024 වසරේ පැමිණිලි විභාග කිරීමෙ ප්‍රතිශතය 33.33% පමණ අඩුවීමක් නිරීක්ෂණය වේ.

මෙම දත්ත පහත දැක්වෙන 2 වන රූපය මගින් ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.



3 වැනි රූපය

08.6 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය හා වෙනත් විෂමාචාර සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි මිනින්දෝරුවරුන්ට එරෙහිව 2002 අංක 17 දරණ මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව සිදු කරනු ලබන විමර්ශනයකින් අනතුරුව දඬුවම් පැණවිය හැක.

2024 වසරේදී ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 08.4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි, ලැබෙන පැමිණිලි විභාග පවත්වනු ලැබීමෙන් පසුව ගන්නා ලද තීරණ අනුව වූදිත මිනින්දෝරුවරුන් හට පරීක්ෂණ ගාස්තු අයකිරීම් සහ අවවාද කිරීම් ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලැබුවද 2024 වර්ෂයේදීඑසේ අවවාද කිරීම හා පරීක්ෂණ ගාස්තු අයකිරීම සිදුකර නැත.

එක් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයකුගේ ලියාපදිංචිය අවලංගු කිරීමට සභාව කටයුතු කර ඇත.

ලියාපදිංචි අංකය	මිනින්දෝරුවරයාගේ නම	තීරණය
20082470	සී.ඩබ්.කුලසිංහ මිය	2024.07.26 දින සිට ලියාපදිංචිය අවලංගු කිරීම

09. අධ්‍යාපන හා පුහුණු වැඩ කටයුතු

09.1 ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් මැනුම් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් ඔවුන් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස මැනුම් වෘත්තියට පිවිසෙන මුල්ම අවස්ථාවේදී ඒ සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ද ඉඩම් මැනුම් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා පුළුල් ශාස්ත්‍රීය දැනුමක් සහ විශේෂයෙන් මැනුම් ක්ෂේත්‍රයේ මනා පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් මෙම නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය ඥානය අවබෝධය, සහ මහපෙන්වීම ලබා දෙනු ඇත. මැනුම් වෘත්තිකයෙකු ලෙස ප්‍රථම වරට එම වෘත්තියට පිවිසීමේ දී, කිසිදු අපහසුතාවයකින් හෝ ගැටළුකාරී තත්වයකින් තොරව ආරම්භයේ සිටම මහජනයාට උසස් හා ගුණාත්මක සේවාවක් ලබා දීමට ලියාපදිංචි මිනින්දෝරුවරයා යොමු කිරීම මෙම දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීමෙහි ප්‍රධානතම අරමුණවේ. කෙසේවුවද 2024 වර්ෂයේදී රට තුල ආර්ථික ඇතුළු වෙනත් අර්බුදකාරී තත්වය හමුවේ ප්‍රථමවරට වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා ගන්නා ලද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට සමාලෝචිත වර්ෂය සඳහා දිශානුගත කිරීමේ පාඨමාලාවක් පැවැත්වීමට නොහැකි විය.

09.2 අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CDP) පාඨමාලා

විශේෂයෙන් බිම්මැනීම හා සම්බන්ධ විෂය ගත්කල, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් අත්‍යවශ්‍ය අංගයක් වේ. වර්තමාන සාමාජීය, ආර්ථික මෙන්ම නෛතිකමය වශයෙන් මෙන්ම සහ තාක්ෂණික වශයෙන් සිදුවන වෙනස්කම් වලට අනුරූපි ලෙස උසස් හා ගුණාත්මක පිඹුරු හා සිතියම් නිෂ්පාදනය සඳහා මැනුම් වෘත්තිකයින්ට මෙවැනි වැඩ සටහන් වලින් ලැබෙන දැනුම හා මාර්ගෝපදේශයන් ඉතාමත් මහෝපකාරීවේ.
මැනුම් වෘත්තියේ යෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩි දියුණු කරලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ සඳහන්ව ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි කරවීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් නිරතුරුවම සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියැලීමට අපේක්ෂා කරන ආධුනික මැනුම් වෘත්තිකයින් (ප්‍රථම වරට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා ගන්නා මිනින්දෝරුවරුන් සඳහා) දිශානුගත කිරීමේ වැඩසටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම වලට අදාල වැඩසටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය හා අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂයෙන්ම භාහිර ආයතන හා හෝ සංවිධාන විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේදී, ඒ සඳහා සහභාගි කර ගන්නා සම්පත් දායකයිනගේ ශාස්ත්‍රීය හා විශේෂඥ දැනුම මෙන්ම ඔවුන් නියෝජනය කරන ක්ෂේත්‍රයන්හි දක්වා තිබෙන නිපුණතාව කෙරෙහි ඉඩම් මැනුම් සභාව විශේෂ අවධානයකින් කටයුතු කරනු ලබයි.

එසේම සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවට අමතරව ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ ගම්පහ, කුරුණෑගල හා යාපනය යන දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් දක්වා ඇති උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත්වන අතර එම පාඨමාලා ඉඩම් මැනුම් සභාව විසින් පිළිගැනීමට ලක්කර ඇත.

2024 වසරේදී පවත්වා ඇති අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ

	ආයතනය	වෘත්තීය සංවර්ධන පාඨමාලාව	පැවැත්වූ දිනය
1	ඉඩම් මැනුම් සභාව	Management of tenement list in digital environment and cadaster system	2024.02.09
2	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	Land Valuation	2024.02.18
3	නුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු වරුන්ගේ සංගමය	Online Tenement List Preparation & Subdivision surveys in Bim Saviya Area	2024.02..20
4	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	Geometric Accuracies of Remotely Sensed Images	2024.03.11
5	ඉඩම් මැනුම් සභාව	Land Management	2024.04.19
6	ඉඩම් මැනුම් සභාව	Professional Ethics	2024.06.14
7	යාපනය දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු වරුන්ගේ සංගමය	sustainable Land Administration System for National Development	2024.06.21
8	ඉඩම් මැනුම් සභාව	Bim Saviya & Subsequence Surveys	2024.07.30
9	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	Procedures of Subsequent Surveys of Bim Saviya Surveys	2024.08.31
10	ඉඩම් මැනුම් සභාව	Sustainable Land Administration System for National Development	2024.09.12
11	යාපනය දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු වරුන්ගේ සංගමය	Advantages of using National Coordinates & QGIS Applications	2024.09.28
12	ඉඩම් මැනුම් සභාව	GNSS Technology and SLCORS Network	2024.10.25
13	ඉඩම් මැනුම් සභාව	LIS and future Development	2024.11.22
14	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	The Role of Hydrography in Reverine Management	

10. මූල්‍ය කළමනාකරණය

10.1 ආදායම් සහ වියදම

2023 වර්ෂයේ දී ඉඩම් මැනුම් සභාව ඉපැයූ ආදායම රු.11387444.00ක් වන අතර, 2024 වර්ෂයේ ආදායම රු.11,416,807 කි. ඒ අනුව 2023 වර්ෂය හා සැසඳීමෙහිදී මෙම වර්ෂය තුල දී සභාව ඉපැයූ ආදායම පෙර වර්ෂයට වඩා රු.29363.00 කින් වැඩි වී ඇත.

2023 වර්ෂය සඳහා සභාව දරන ලද වියදම රු. 8233277.00 වන අතර 2024 වර්ෂයෙහි සභාවේ වියදම රු. 8360712.00 කි.

ඒ අනුව 2024 වසර තුළදී සභාව රු. 3,029,875.00 ක ශුද්ධ ලාභයක් ලබා ඇත.

2023 සහ 2024 වර්ෂයන්හි සභාවේ ආදායමෙහි හා වියදමෙහි ප්‍රස්ථාරික නිරූපණය පහත දැක්වේ.



10.2 සභාවේ අරමුදල්

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ධ අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඉටු කිරීමෙන් සභාවට ලැබෙන මුදල් ද, සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග, ප්‍රධාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56(3) වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

2024 වසර සඳහාද පෙර වර්ෂයන්හි මෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් කිසිදු ප්‍රතිපාදන මුදලක් සභාව වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී නැත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී ඊට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරන ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. එලෙස එක් රැස් කර ගන්නා සියලු මුදල් මැනුම් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව, ශාස්ත්‍රීය සුදුසුකම් ලත් අය සඳහා සභාවේ ලියාපදිංචිය ලබා

දීම, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන පැමිණිලි භාර ගෙන පරීක්ෂන පැවැත්වීමෙන් සහ අවස්ථානුකූලව පරීක්ෂණ ගාස්තු ලෙස වෘත්තීය මිනින්දෝරුවරුන්ගෙන් අයකරන පරීක්ෂණ ගාස්තු ආදියෙන්ද මැනුම් සභාවට අරමුදල් එක් රැස් වේ.

2024 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට මැනුම් සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ තිබූ අරමුදල් ශේෂය රු.23,200,000.00 ක් විය.

10.3 සභාවේ මූල්‍ය විගණන කටයුතු

10.3.1 අභ්‍යන්තර විගණන කළමනාකරණ රැස්වීම

මැනුම් සභාව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ. විගණන කළමනාකරණ කමිටුවක්ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එහි සංයුතිය පහත සඳහන් සාමාජිකයින්ගෙන් හා සභාවේ නිළධාරීන්ගෙන් සමන්විත වේ.

i. මුදල් අමාත්‍යාංශ නියෝජිත (සභාපති)
ii. මැනුම් සභාවේ සාමාජිකයකු (සාමාජික)
iii. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු (නිරීක්ෂක)
iv. ඉඩම් අමාත්‍යාංශයෙහි නියෝජිතයෙකු (සාමාජික)
v. මැනුම් සභාවේ ගණකාධිකාරී
vi. මැනුම් සභාවේ ලේකම්

සාමාන්‍යයෙන් මෙම කමිටුව ත්‍රෛමාසිකව රැස් වන අතර එහිදී, සභාවේ කටයුතු විශ්ලේෂණාත්මකව විමසා බලනු ලැබීමෙන් පසු එකී කමිටු වාර්තා මැනුම් සභාවේ අවධානයට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරේ. කෙසේ වුවද 2024 වර්ෂය තුලදී අභ්‍යන්තර විගණන කළමනාකරණ රැස්වීම 03 ක් පමණක් පවත්වා ඇත.

එම රැස්වීම සඳහා සමාජිකයින් හා සභාවේ නිළධාරි සහභාගිවීම පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	සහභාගි වූ රැස්වීම ගණන
1	ඩී.සී.ජයදේව මිය	සභාපති	03
2	කේ.පී.එස්.ජේ සමරනායක මිය	නිරීක්ෂක	03
3	එම්.පී.නාසූර් මයා	සාමාජික	03
4	බී.ආර්.එල්.පෙරේරා මිය	සාමාජික	03
5	ඩබ්.ඩී.එස්.පී.සිරිවර්ධන මයා	ගණකාධිකාරි (අර්ධකාලීන)	01
6	කේ.එල්.ඒ.එන්.සඳමාලි මිය	ගණකාධිකාරි (අර්ධකාලීන)	01
7	සී.ජේ.වැල්ලගේ මයා	ලේකම් (වැඩබලන)	03

2024 වසර සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිගේ විගණන වාර්තාව මෙහි අඩංගු කොට ඇත.

ඩී.පී.වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

ඩබ්.ජී.ගුණතිලක
සභාපති
ඉඩම් මැනුම් සභාව

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

සභාපති
ඉඩම් මැනුම් සභාව

11. 2024 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය

(ඇමුණුම්)

කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ගඅමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 දෙසැම්බර් 31 වැනි දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

	සටහන්	2024	2023
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ		949,774	2,029,117
ලැබිය යුතු	5	936,855	1,509,668
තොග	2	196,234	300,842
ආපදා ණය	3	-	76,547
උත්සව අත්තිකාරම්		-	2,500
පූර්ව තැපැල් වියදම්		-	24,970
රඳවාගත් බදු		123,898	79,404
		2,206,761	4,023,047
ජංගම නොවන වත්කම්			
ස්ථාවර තැන්පතු	4	23,200,000	18,515,585
අස්පෘශ්‍ය වත්කම්	1	13,159	16,449
දේපළ, පිරියත සහ උපකරණ	1	76,153,002	76,065,946
		99,366,160	94,597,979
මුළු වත්කම්		101,572,921	98,621,027
හිමිකම් සහ වගකීම්			
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	7	503,218	769,337
පූර්ව වශයෙන් ලැබූ ආදායම්	8	8,252,365	7,716,362
ගෙවිය යුතු ආදායම් බදු		854,864	-
		9,610,447	8,485,699
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම	6	454,860	803,225
මුළු වගකීම්		10,065,307	9,288,924
ශුද්ධ වත්කම්		**91,507,614**	**89,332,103**
හිමිකම්			
ප්‍රාග්ධන දායකත්වය දරනුයේ:			
මහා භාණ්ඩාගාරය		1,043,030	1,043,030
උපචිත අරමුදල		88,289,573	85,158,406
අතිරික්තය/(ඌනතාවය)		2,175,011	3,130,667
		90,464,584	88,289,073
මුළු හිමිකම්		**91,507,614**	**89,332,103**

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම් කරන ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

D.P.Wickramasingha
Secretary
Ministry of Agriculture, Livestock, Land and Irrigation

D.P. Wickramasinghe
Secretary
Ministry of Agriculture, Livestock, Land and Irrigation
"Mihikatha Madura" Land Secretariat,
No. 1200/6, Rajamalwatta Avenuue,
Battaramulla.

Y.G.Gunathilaka
Chairman
Land Survey Council

Chairman
Land Survey Council

K.L.N.A.Sandamali
Accountant
Land Survey Council

Accountant
Land Survey Council

කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ගඅමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

	සටහන්	2024	2023
ආදායම්			
බලපත්‍ර ගාස්තු		4,962,500	4,987,500
ලියාපදිංචි කිරීමේ ගාස්තු		95,000	236,000
ස්ථාවර තැන්පතු පොලිය	9	2,477,929	3,358,893
වෙනත් ආදායම්	10	1,495,253	579,051
වැඩමුළුවලින් ලත් ශුද්ධ ආදායම	11	2,386,125	2,226,000
මුළු ආදායම		**11,416,807**	**11,387,444**
අඩු කළා: වියදම්			
පරිපාලන හා ආයතනික			
විගණන ගාස්තු		169,920	239,040
ක්‍රමක්ෂය පිරිවැය	1	3,290	1,828
ක්ෂය කිරීම්	1	507,287	226,639
විදුලි වියදම්		201,600	134,400
අනෙකුත් දීමනා	13	1,700,395	1,975,241
අනෙකුත් වියදම්	16	929,345	929,923
පුද්ගල පාරිශ්‍රමික	12	3,620,789	3,035,366
පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව	15	179,043	251,620
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	6	21,635	51,185
රැස්වීම් සඳහා සංග්‍රහ වියදම්		197,140	235,335
ලිපිද්‍රව්‍ය	2	233,631	341,713
ටෙලිකොම්/ තැපැල් හා සන්නිවේදන කටයුතු		211,830	275,600
ගමන් වියදම්	14	377,607	530,588
ජල බිල්පත්		7,200	4,800
		8,360,712	**8,233,277**
මූල්‍ය හා වෙනත් වියදම්			
බැංකු ගාස්තු		26,220	23,500
මුළු වියදම්		**8,386,932**	**8,256,777**
බදු පෙර අතිරික්තය/ (ඌනතාවය)		**3,029,875**	**3,130,667**
අඩු කළා: ආදායම් බදු වියදම්		**(854,864)**	-
අතිරික්තය/ (ඌනතාවය)		**2,175,011**	**3,130,667**

කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ගඅමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	සටහන්	2024	2023
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
බදු පෙර අතිරික්තය/ (ඌනතාවය)		**3,029,875**	**3,130,667**
<u>ගැලපුම් කළා</u>			
ක්‍රමක්ෂය	1	3,290	1,828
ක්ෂය කිරීම	1	507,287	226,639
මුදල් නොවන ආදායම් බදු වියදම		123,898	-
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	6	21,635	51,185
බොල් ණය සඳහා (අධි)/ ඌන වෙන්කිරීම	16	-	32,800
සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්	17	500	(124,377)
ස්ථාවර තැන්පතු පොලිය		(2,477,930)	(3,358,893)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පූර්වයෙන් මෙහෙයුම් ලාභය		**1,208,555**	**(40,152)**
<u>කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම</u>			
තොග (වැඩිවීම)/අඩු වීම	2	104,608	82,506
ආපදා ණය (වැඩිවීම)/අඩු වීම	3	76,547	109,992
උත්සව අත්තිකාරම් සහ අනෙකුත් අත්තිකාරම් (වැඩිවීම)/අඩු වීම		2,500	(2,500)
ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩු වීම	5	(6,000)	(833,621)
පූර්ව තැපැල් ගාස්තු වියදම(වැඩිවීම)/අඩු වීම		24,970	(24,970)
ගෙවිය යුතු මුදල් (වැඩිවීම)/අඩු වීම	7	(266,118)	180,008
ආදායම්වල පූර්ව ලැබීම් (වැඩිවීම)/අඩු වීම	8	536,003	(811,800)
රඳවාගත් බදු (වැඩිවීම)/අඩු වීම		(44,495)	(79,404)
මෙහෙයුම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**1,636,570**	**(1,419,941)**
පාරිතෝෂික ගෙවීම්		(370,000)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**1,266,570**	**(1,419,941)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ස්ථාවර තැන්පතුවල සිදුකළ ආයෝජන	4	(13,000,000)	(19,015,585)
ස්ථාවර තැන්පතු කල්පිරීමෙන් ලැබූ ආදායම		8,315,585	18,440,464
ස්ථාවර වත්කම් මිලදී ගැනුම්	1	(594,343)	(214,004)
ලැබූ පොලී ආදායම	9	2,932,845	3,358,892
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(2,345,913)**	**2,569,767**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
මුදල් හා මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**(1,079,343)**	**1,149,827**
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**2,029,117**	**879,290**
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**949,774**	**2,029,117**

කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ගඅමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

රු.

විස්තරය	සටහන්	ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අතිරික්තය/(හිඟය)	එකතුව
2024 ජනවාරි මස 01 දිනට ශේෂය		1,043,030	88,289,073	89,332,103
සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම	17	-	500	500
අතිරික්තය/ (ඌනතාවය) 2024		-	2,175,011	2,175,011
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,043,030**	**90,464,584**	**91,507,614**

කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ගඅමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රු.

සටහන 1: දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය

අයිතමය	2024.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතු කිරීම්	අඩු කිරීම්	ගැලපුම්	2024.12.31 දිනට ශේෂය
ස්ථාවර වත්කම්					
ඉඩම්	75,100,000	-	-	-	75,100,000
යන්ත්‍රෝපකරණ	678,488	-	-	-	678,488
ගෘහභාණ්ඩ	736,166	-	-	-	736,166
පරිගණක සහ උපාංග	1,426,719	327,250	-	-	1,753,969
කාර්යාල උපකරණ	94,967	267,093	-	-	362,060
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	82,252	-	-	-	82,252
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම)	430,397	-	-	-	430,397
	78,548,989	594,343	-	-	79,143,332
අස්පෘශ්‍ය වත්කම්					
ගිණුම්කරණ මෘදුකාංග	50,949	-	-	-	50,949
	50,949	-	-	-	50,949
එකතුව	78,599,938	594,343	-	-	79,194,281

ක්ෂය කිරීම්/ හානිකරණය

අයිතමය	2024.01.01 දිනට ශේෂය	වාර්ෂික ක්ෂය කිරීම	අඩු කිරීම්	ක්ෂය කිරීම් %	ගැලපුම්	2024.12.31 දිනට ශේෂය
ස්ථාවර වත්කම්						
යන්ත්‍රෝපකරණ	576,326	34,054		-		610,380
ගෘහභාණ්ඩ	379,932	71,247		33.33%		451,179
පරිගණක සහ උපාංග	1,014,019	246,626		20%		1,260,645
කාර්යාල උපකරණ	92,113	134,974		33.33%		227,087
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	75,628	3,312		50%		78,940
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම)	345,026	17,074		50%		362,100
	2,483,043	507,287	-		-	2,990,331
අස්පෘශ්‍ය වත්කම්						
ගිණුම්කරණ මෘදුකාංග	34,500	3,290		20%		37,790
	34,500	3,290	-		-	37,790
	2,517,544	510,577	-		-	3,028,121

ශුද්ධ පොත් අගය

අයිතමය	2024.01.01 දිනට ශේෂය	2024.12.31 දිනට ශේෂය
ස්ථාවර වත්කම්		
ඉඩම්	75,100,000	75,100,000
යන්ත්‍රෝපකරණ	102,162	68,108
ගෘහභාණ්ඩ	356,234	284,987
පරිගණක සහ උපාංග	412,700	493,324
කාර්යාල උපකරණ	2,854	134,973
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	6,624	3,312
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම)	85,371	68,297
	76,065,946	76,153,002
අස්පෘශ්‍ය වත්කම්		
ගිණුම්කරණ මෘදුකාංග	16,449	13,159
	16,449	13,159
	76,082,394	76,166,160

කෘෂිකර්ම පශුසම්පත් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රු.

සටහන 1.1 - අනුපාතිකවල වෙනස්වීම

2024 මූල්‍ය වර්ෂය තුළ දී, යාවත්කාලීන කළ ප්‍රයෝජනවත් ජීව කාලය මත පදනම්ව සියලු වත්කම් කාණ්ඩවල ක්ෂය කිරීම් අනුපාතික ඉඩම් මැනුම් සභාව විසින් යාවත්කාලීන කරන ලදී. මෙම සංශෝධන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සිදුකරන ලද අතර යථායෝගී පදනමින් උපයෝගීකර ගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශන මත මෙම වෙනස්කිරීම්වල ප්‍රතිඵල පහත පරිදි වේ:

- ක්ෂය කිරීම් අනුපාතික සංශෝධනය කිරීම ඔස්සේ රු. 127,049/- අතිරේක ක්ෂය වියදමක් ප්‍රතිඵල වී තිබේ.

සටහන 2:	**2024.12.31 දිනට තොග**		
2024 ජනවාරි 01 දිනට තොග ආරම්භක ශේෂය		300,842	
එකතු කළා: වර්ෂය තුළ මිලදී ගැනුම්		129,023	
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලිපිද්‍රව්‍ය වියදම		(233,631)	
	2024 වර්ෂ අවසාන තොගය		196,234

සටහන 3:	ආපදා ණය		
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී		-	
ටී.පී.ප්‍රනාන්දු		-	
එකතුව			-

රු.

සටහන 4:	ස්ථාවර තැන්පතු				
ස්ථාවර තැන්පතු අංකය	ආරම්භ කළ දිනය	කාල සීමාව	තැන්පතු වටිනාකම		
87153136	2021.02.22	වසර 1	1,000,000		
88345281	2022.01.07	වසර 1	1,000,000		
90657158	2023.04.26	වසර 1	700,000		
90753437	2023.05.18	වසර 1	3,000,000		
90949435	2023.05.23	වසර 1	3,500,000		
91319643	2023.08.02	මාස 06	1,000,000		
91319580	2023.08.02	මාස 06	1,000,000		
92945763	2024.06.14	වසර 1	1,000,000		
92967681	2024.06.20	වසර 1	2,500,000		
93378243	2024.09.12	වසර 1	1,000,000		
93441060	2024.09.26	මාස 06	2,000,000		
93745781	2024.11.25	වසර 1	1,000,000		
92213783	2024.01.29	මාස 06	1,500,000		
93627324	2024.10.30	මාස 06	3,000,000		
				23,200,000	
එකතුව					23,200,000

සටහන 5:	ලැබිය යුතු ආදායම		
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය		929,855	929,855
විමර්ශන සඳහා ලැබිය යුතු ගාස්තු		7,000	
බොල් ණය සඳහා වෙන්කිරීම		-	7,000
එකතුව			936,855

සටහන 6:	පාරිතෝෂික සඳහා වෙන් කිරීම				
නම	බැඳුන වර්ෂය	2023 වර්ෂය දක්වා	වර්ෂය තුළ වෙන්කිරීම	සිදුකළ ගෙවීම	එකතුව
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී	2004	454,860	-	-	454,860
ටී.පී.ප්‍රනාන්දු	2004	348,365	21,635	(370,000)	-
එකතුව		803,225	21,635	(370,000)	454,860

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රු.

සටහන 7:	උපචිත වියදම්	
උපචිත විගණන ගාස්තු	169,920	
උපචිත සන්නිවේදන සහ තැපැල් වියදම්	4,592	
උපචිත සභා දීමනා	21,000	
ගෙවිය යුතු මුද්දර බදු	259,500	
උපචිත Accsoft විසඳුම	11,773	
උපචිත ඉඩම් මැනුම් සභාවේ ගමන් වියදම්	12,000	
උපචිත භාෂා පරිවර්තන ගාස්තු	24,433	
උපචිත සුහුරු බලපත්‍ර මුද්‍රණ ගාස්තු	-	
එකතුව		503,218

සටහන 8:	පූර්ව ආදායම් ලැබීම්	
ලියාපදිංචි ගාස්තු	125,700	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් පූර්ව අත්තිකාරම්	4,791,652	
ලියාපදිංචිය (CA/WRIT/108/2021)	535,513	
බලපත්‍ර ගාස්තු ප්‍රමාද වී ලැබීම	13,000	
බලපත්‍ර ආදායම් වශයෙන් පූර්ව ලැබීම්	2,786,500	
එකතුව		8,252,365

කෘෂිකර්ම පශුසම්පත් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රු.

සටහන 9:	ස්ථාවර තැන්පතු පොලිය		
ස්ථාවර තැන්පතුවේ අංකය	පොලිය	ලැබිය යුතු පොලිය	ලැබිය යුතු රඳවාගැනීමේ බදු
FD INTEREST:FD INTEREST 90657158	40,950	43,151	2,158
FD INTEREST:FD INTEREST 90731647	240,205	-	-
FD INTEREST:FD INTEREST 90753437	228,086	149,996	7,895
FD INTEREST:FD INTEREST 90777631:FD INTEREST 90949435	257,638	172,672	9,088
FD INTEREST:FD INTEREST 91319580	65,699	34,356	1,718
FD INTEREST:FD INTEREST 91319643	65,699	34,356	1,718
FD INTEREST:FD INTEREST 91646794	170,137	-	-
FD INTEREST:FD INTEREST 91795666	14,301	-	-
FD INTEREST:FD INTEREST 91937807	142,732	-	-
FD INTEREST:FD INTEREST 92118669	28,671	-	-
FD INTEREST:FD INTEREST 92945763	-	46,808	2,340
FD INTEREST:FD INTEREST 92967681	-	113,527	5,676
FD INTEREST:FD INTEREST 93378243	1,292	24,557	1,292
FD INTEREST:FD INTEREST 93441060	-	46,507	2,325
FD INTEREST:FD INTEREST 93627324	-	44,014	2,201
FD INTEREST:FD INTEREST 93745781	430	8,186	431
FD INTEREST:FD INTREST 87153136	97,096	79,575	3,979
FD INTEREST:FD INTREST 88345281	82,631	107,890	5,395
FD INTEREST:FD INTREST 92213783	84,999	51,768	2,725
එකතුව	**1,520,565**	**957,364**	**48,940**
		2,477,929	

කෘෂිකර්ම පශුසම්පත් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රු.

සටහන 10:	අනෙකුත් ආදායම්	
පැමිණිලි ආදායම	89,000	
විභාග ගාස්තු 2024	750,000	
පිඹුරු නිකුත් කිරීමේ ලේඛන අලෙවිය	37,500	
සේවා ගාස්තු ආදායම	2,000	
බලපත්‍ර ගාස්තු ගෙවීම ප්‍රමාදවීම සඳහා ගාස්තුව	447,000	
ආපදා ණය පොලිය	1,296	
අනෙකුත් ආදායම්	116,240	
වැටුප් රහිත නිවාඩු	23,667	
මහජනතාව වෙත තොරතුරු නිකුත් කිරීම	28,550	
එකතුව		1,495,253

සටහන 11:	වැඩමුළුවලින් ලැබූ ශුද්ධ ආදායම	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -30	197,500	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -34	330,000	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -35	480,000	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -37	579,000	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -39	231,000	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -41	294,000	
ආදායම: අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන -43	66,000	
SISL අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනෙහි ආදායම	-	
Out CPD ආදායම	208,625	
එකතුව		2,386,125

සටහන 12:	පුද්ගල වේතන	
මූලික වැටුප	2,045,246	
ජීවන වියදම් දීමනාව	351,600	
සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% දායකත්වය	375,352	
සේවක භාරකාර අරමුදල සඳහා 3% දායකත්වය	93,838	
දීමනාවල හිඟහිටි මුදල්	25,000	
අනෙකුත් දීමනා	729,753	
එකතුව		3,620,789

සටහන 13:	අනෙකුත් දීමනා	
සභාපති සඳහා දීමනාව	450,000	
උප සභාපති සඳහා දීමනාව	360,025	
ලේකම් සඳහා දීමනාව	159,525	
ගණකාධිකාරී සඳහා දීමනාව	142,845	
විගණන හා කළමනාකරණ කමිටු දීමනාව	48,000	
සභා දීමනාව	540,000	
එකතුව		1,700,395

කෘෂිකර්ම පශුසම්පත් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රු.

සටහන **14:**	ගමන් වියදම්	
ඉඩම් මැනුම් සභාවේ රැස්වීම	284,009	
කාර්ය මණ්ඩල පුහුණු	13,500	
අධිකරණය වෙත යෑම	17,720	
රට අභ්‍යන්තර ගමන් වියදම්	62,378	
එකතුව		**377,607**

සටහන **15:**	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීම	
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	167,270	
QB පැකේජය	11,773	
එකතුව		**179,043**

සටහන **16:**	අනෙකුත් වියදම්	
ප්‍රචාරණ - ගැසට් නිවේදන	268,356	
භාෂා පරිවර්තන කටයුතු	123,808	
මුද්‍රණ සහ පොත් බැඳීම් ගාස්තු	31,730	
යුහුරු බැලපත්‍ර මුද්‍රණය කිරීමේ ගාස්තු	314,175	
ලියාපදිංචිය සඳහා සම්මුඛ පරීක්ෂණ	19,338	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා වියදම්	66,360	
නැවත ආපසු අයකර ගත නොහැකි රඳවා ගැනීමේ බදු ගාස්තු	79,404	
විවිධ වියදම්	26,174	
එකතුව		**929,345**

සටහන **17:**	සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්					
2023.01.01 දිනට ශේෂය					**88,289,073**	
මුද්දර ගාස්තු	240699/19770726 ඒ.එන්.අල්විස්			500		
					500	
ගැලපුම්වලින් පසු ශේෂය						**88,288,573.00**

සටහන **18:**	නීති කෘත්‍යයන්			
CA(WRIT)219/2019	ඩී.එම්.පී.හේමන්ති පෙරේරා		2019.07	ඉඩම් මැනුම් සභාවේ සහ මිනුම්පතිගේ තීරණයට එරෙහිව
SPL 256	ප්‍රේමකුමාර රණසිංහ		2020.10.12	ඉඩම් මැනුම් සභාවේ සහ මිනුම්පතිගේ තීරණයට එරෙහිව
SC/SPL/LA/466/2019	සාලිය වික්‍රමසිංහ		2020.05.27	ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය
SC/SPL/LA/184/2021	භානිය උඩුමගල		2021.10.26	ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය
SC/SPL/LA/376/2019	අජිත් පුෂ්පකුමාර		2019.11.14	ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය
SC/SPL/LA/382/2019	අජිත් පුෂ්පකුමාර		2020.01.08	ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය

ඉහත සඳහන් කළ නඩු කටයුතු දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතී.

කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1. පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කර ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම අනුව පිළියෙල කර ඇත.

1.3. මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

2. දේපළ, පිරියත හා උපකරණ

හඳුනා ගැනීමේ පදනම
ඉඩම් - ඉඩම් සාධාරණ අගය මත සටහන් කර ඇත.
අනෙකුත් වත්කම් - ඓතිහාසික පිරිවැය යටතේ හඳුනාගැනේ.

2.1. දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීමෙන් පසු නැවත අයකර ගත හැකි අගයට ගිණුම් ගත කරනු ලැබේ.

2.2. ක්ෂය කිරීම

හීනවන ශේෂ ක්‍රමයට පහත අනුපාතික යටතේ ඉකුත් වර්ෂය හා අනුකූලව ක්ෂය කිරීම් දක්වා ඇත. වත්කම් මිලදී ගනු ලබන වර්ෂයේ දී පූර්ණ වශයෙන් ක්ෂයකරනු ලබන අතර භාවිතයෙන් ඉවත්කරනු ලබන වර්ෂයේ දී ක්ෂය කිරීම් සිදුනොකරනු ලැබේ.

වත්කම් වර්ගය	%
යන්ත්‍රෝපකරණ	33.33
ගෘහභාණ්ඩ	20
පරිගණක හා උපාංග	33.33
කාර්යාලීය උපකරණ	50
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	50
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම්)	20
ගිණුම්කරණ මෘදුකාංග	20

3.බැංකුවල ඇති තැන්පතු හා බැංකුවේ ඇති මුදල්

බැංකු වල ඇති තැන්පතු සම්පූර්ණ වශයෙන්ම සමන්විත වනුයේ ලංකා බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු වශයෙනි.

4. පොලී ආදායම හඳුනාගැනීම

පොලී ආදායම උපචිත පදනමින් හඳුනාගනු ලැබේ. ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය වර්ෂයේ පොලී ආදායම තුළ ඇතුළත් වේ.

5. බොල් ණය සඳහා වෙන් කිරීම

වසර එකකට වඩා වැඩි ණයකරුවන් සඳහා 100%ක් වෙන් කෙරේ.

12. විගණකාධිපති වාර්තාව 2024

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/F/LSC/1/24/17 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 ජූලි 18 දින

21 JUL 2025

සභාපති

ඉඩම් මැනුම් සභාව

ඉඩම් මැනුම් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ඉඩම් මැනුම් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2002 අංක 17 දරන මැනුම් පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ.මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමෙ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමෙ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමෙ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 අංක 12 දරන තොරතුරු පනතේ 25(1) වගන්තිය	තොරතුරු නිලධාරියෙකු විසින් හැකි ඉක්මනින් සහ ඉල්ලීමක් ලැබී දින 14 ක් ඇතුළත අදාළ තීරණය, ඉල්ලීම කළ පුරවැසියාට වහාම සන්නිවේදනය කළ යුතු බව සඳහන් වුවද 2022 වර්ෂයේ ලද තොරතුරු ඉල්ලීම් 03 කට හා 2023 වර්ෂයේ ලද තොරතුරු ඉල්ලීම 06 කට 2024 වර්ෂය අවසන් වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. 2024 වර්ෂයේ ලද තොරතුරු ඉල්ලීම 14 කින් 02 කට පිළිතුරු ලබා දී නොමැති අතර පිළිතුරු ලබාදුන් ඉල්ලීම 12 අතරින් ඉල්ලීම 05ක් සඳහා දින 14 ඉක්මවා දින 05 සිට දින 307 ක පරාසයක කාල පමාවක් සිදු වී තිබුණි.
(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතේ	
2.3 ඡේදය	සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම පිළියෙල කර නොතිබුණි.
(ඇ) 2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනත	
(i) 32(1) වගන්තිය	සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු සිටිය යුතු වුවත් 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලේකම්වරයෙකු පත් කර නොතිබුණි.
(ii) 37(උ) වගන්තිය	ඉඩම මැනීමෙ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය,පුහුණුව,පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම ක්‍රියාත්මක කිරීමෙ කාර්යයන් ඉටු කර නොතිබුණි.

(iii) 39(3) වගන්තිය

මිනින්දෝරුවරයෙකු ලෙස ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීම නියමිත ආකෘති පත්‍රය සමඟ නියමිත ගාස්තුවද සමඟ ඉදිරිපත් කළ යුතු අතර ලියාපදිංචිය සඳහා මුදල් ගෙවීම හා අයදුම්පත් ඉදිරිපත් කිරීම යන කාර්යයන් පිළිබඳ නිසි නියාමනයක් නොතිබුණි. ලියාපදිංචි අංකය නිකුත් කර ඒ සඳහා මුදල් ගෙවීමට ප්‍රමාද කාලය දින 14 ත් අවුරුදු 10 ත් අතර කාල පරාසයක විය. නැවත ලියාපදිංචිය අලුත් කර අදාල සහතිකය ලබා ගන්නා අවස්ථාවේදී එසේම එම හිඟ මුදල් අය කර ගන්නා බැවින් එකී හිඟ මුදල් අය කර ගැනීම සඳහා මෙලෙස විශාල කාල පමාවක් සිදුව තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) සභාව වෙත ඉදිරිපත් කෙරෙන මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට විසඳා නොමැති පැමිණිලි 134 ක්ද, 2023 වර්ෂය සඳහා ලද පැමිණිලි 78 ක්ද සමග මුළු පැමිණිලි 212 ක් වූ අතර ඉන් පැමිණිලි 63 ක් විසඳා තිබුණි. 2023 වර්ෂයේ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය සියයට 30 ක් විය. 2024 ලද පැමිණිලි 56 ක් සමග මුළු පැමිණිලි 205 ක් වූ අතර ඉන් පැමිණිලි 42 ක් විසඳා තිබුණි. 2024 වර්ෂයේ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය සියයට 20 ක් විය. ඒ අනුව පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය සියයට 10 කින් අඩුවී තිබුණි. 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පැමිණිලි 90 ක් විසඳීමට සැලසුම් කර තිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)